# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජූලි 2026

## (1901) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

---

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුරට අදාල අංකයද, ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් ප්‍රකාශය **'සත්‍ය'** හෝ **'අසත්‍ය'** සහ ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි උත්තරය ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

මෙම ප්‍රශ්නය මගින් ඉදිරිපත් කර ඇති පිළිතුරු අතරින් "ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ කුමක්ද" යන්න විමසා තිබුණි. මේ සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුර වන අංක 2 ලබා දී තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන් අංක (1) හා (3) ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

මෙම ප්‍රශ්නය මගින් ඉදිරිපත් කර ඇති පිළිතුරු අතරින් "ගිණුම්කරණයේ මූලිකාංගයක් නොවන්නේ කුමක්ද" යන්න විමසා තිබුණි. සියලුම අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුර වන අංක (4) ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

මෙම ප්‍රශ්නය මගින් ඉදිරිපත් කර ඇති පිළිතුරු අතරින් "ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ යෙදවුමක් ලෙස සලකනු ලබන්නේ කුමක්ද" යන්න විමසා තිබුණි. සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුර වන අංක 3 ඉදිරිපත් කර තිබුණ අතර, අනෙකුත් සියලුම අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගෙන අංක (1), (2) සහ (4) වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව 2026 මාර්තු 31 දිනට සමන් ට්‍රේඩර්ස් හි ලාභය ගණනය කර, දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුරු කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව ලාභය ගණනය කර අංක (3) රු.1,600,000/- ක් ලෙස ඉදිරිපත් කර තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් විසින් වැරදි ගණනය කිරීම් මත අංක (1) රු. 400,000/- හා අංක (4) රු.1,400,000/- ක් ලෙස වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.5**

මෙම ප්‍රශ්නය මගින් දේපළ, පිරියත සහ උපකරණ, ණයට ගැනීමක් සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලියවිල්ල වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර අංක (2) ඉදිරිපත් කර තිබුණු අතර, අනෙකුත් සියලුම අයදුම්කරුවන් විසින් අංක (1) වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

ඉදිරිපත්කර ඇති තොරතුරු පදනම් කර ගනිමින් PESTEL සාධකවල වඩාත් සුදුසු වන්නේ කුමන සංයෝජනය ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර අංක (1) ඉදිරිපත් කර තිබූ අතර සමහර අයදුම්කරුවන් විසින් අංක (4) වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.7**

මෙම ප්‍රශ්නය මගින් ඉදිරිපත් කරන ලද ගනුදෙනුවෙන් ගිණුම් කරන සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න යන්න සඳහන් කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර අංක (2) ඉදිරිපත් කර තිබූ අතර, සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් අංක (1) වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ සැලකීම් අතුරින්, ආරක්ෂණ සංකල්පය (Prudence concept) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් අංක (4) නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි. සමහර අයදුම්කරුවන් විසින් අංක (1), (2) හා (3) වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න න අංක 1.9**

ඉදිරිපත් කර ඇති ගනුදෙනුව සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන් වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන සම්බන්ධයෙන් නිවැරදි අවබෝධය මත අංක (3) නිවැරදිව පිළිතුර ඉදිරිපත් කර තිබුණි. සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බැවින් අංක (2) හා (4) වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

මෙම ප්‍රශ්නය මගින් ශ්‍රී ලංකාවේ භාවිතා වන පොදු ගිණුම්කරණ මෘදුකාංගයක් සඳහා උදාහරණයක් නොවන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස අංක (1) ඉදිරිපත් කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් විසින් වැරදි පිළිතුරක් වන අංක (3) ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා අයදුම්කරුවන් වෙත ලබා දී ඇති එක් එක් ප්‍රකාශය **"සත්‍ය"** හෝ **"අසත්‍ය"** ලෙස උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය.

බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්න අංක **(1.11), (1.12)** හා **(1.14)** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රශ්න අංක **(1.11)** හා **(1.14)** නිවැරදි පිළිතුර "සත්‍ය" ලෙසද ප්‍රශ්න අංක **(1.12)** නිවැරදි පිළිතුර "අසත්‍ය" ලෙසද සටහන් කර තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්න අංක **(1.13)** හා **(1.15)** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබීම මත ප්‍රශ්න අංක **(1.13)** නිවැරදි පිළිතුර **"අසත්‍ය"** වෙනුවට **"සත්‍ය"** ලෙසද ප්‍රශ්න අංක **(1.15)** නිවැරදි පිළිතුර **"සත්‍ය"** වෙනුවට **"අසත්‍ය"** ලෙසද ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **(1.16)** සිට **(1.20)** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර ප්‍රශ්න අංක සමඟ උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය.

**ප්‍රශ්න අංක 1.16**

අස්තිත්වයක් විසින් පරිගණකගත ගිණුම්කරණ පද්ධතියකට මාරු වීමට හේතු දෙකක් (02) ලැයිස්තුගත කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන් විසින් වැරදි පිළිතුරු ඉදිරිපත් කර නොතිබිණි.

**ප්‍රශ්න අංක 1.17**

"වගකීමක්" යන පදය නිර්වචනය කිරීමට උපදෙස් ලබා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් මේ සම්බන්ධයෙන් අංගසම්පූර්ණ නිර්වචනය වන "අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආර්ථික සම්පත් මාරු කිරීමට ආයතනයකට වර්තමානයේ පවතින බැඳීම" යන්න ඉදිරිපත් කර නොතිබිණි. තවත් සමහර අයදුම්කරුවන් විසින් කිසිදු පිළිතුරක් ඉදිරිපත් කර නොතිබිණි.

**ප්‍රශ්න අංක 1.18**

මූලාශ්‍ර ලේඛනයක ඇතුළත් වන කරුණු / අයිතම දෙකක් (02) ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි කරුණු දෙකක් ඉදිරිපත් කර තිබුණු අතර, ඉතා සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.19**

මූලික සටහන් පොත් පවත්වා ගැනීමේ අරමුණු දෙකක් (02) ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි කරුණු ඉදිරිපත් කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් විසින් අදාළ නොවන වැරදි කරුණු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන 2026 මාර්තු 31 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය හඳුනා දක්වන ලෙස උපදෙස් ලබාදී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් හර හා බැර සටහන් නිවැරදිව ගිණුමේ සටහන් කර නිවැරදි අවසාන හර ශේෂය රු.2,200,000/- ලෙස ඉදිරිපත් කර තිබූ අතර, තවත් සමහර අයදුම්කරුවන් හර සටහන බැර ලෙසද, බැර සටහන හර ලෙස හා ලබා දී තිබූ තොරතුරු අඩුවෙන් ගිණුමේ සටහන් කිරීම නිසා අවසාන හර ශේෂය වැරදි ලෙස ඉදිරිපත් කර තිබුණි.

## B - කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත වූ අතර, එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(A)** හා **(B)** ලෙස කොටස් දෙකකින් සමන්විතය.

**(A) කොටසින්** දෛනික ගැනුම් පොත (ගැනුම් ජර්නලය) පිළියෙල කිරීමටත් **(B) කොටසේ (a)** මගින් ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) හා **(b)** මගින් 2026 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමට උපදෙස් ලබා දී තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් විසින් සතුටුදායක මට්ටමක පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර පහත සඳහන් දුර්වලතා හා වැරදි පොදුවේ දක්නට ලැබුණි:

**(A) කොටස:**

(1) නිවැරදි ආකෘතිය අනුව පිළියෙල කර නොතිබිණි.

(2) වෙළඳ වට්ටම් නියමිත පරිදි ගණනය කර නොතිබිණි.

(3) වෙළඳ වට්ටම් අඩු කිරීමට පෙර මුළු වටිනාකම පමණක් සටහන් කර තිබීම.

(4) වෙළඳ වට්ටම පමණක් සටහන් කර තිබීම.

**(B) කොටස:**

**(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත) පිළියෙළ කිරීමේදී පොදුවේ නිරීක්ෂණය වූ දුර්වලතා:**

(1) ලබා දී ඇති ගනුදෙනු අතරින් මුදල්පොත සංශෝධනය කළ යුතු ගනුදෙනු හා බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පෙන්විය යුතු ගනුදෙනු පිළිබඳ නිවැරදි අවබෝධයක් සමහර අයදුම්කරුවන් තුළ නොතිබිණි.

(2) මුදල් පාලන ගිණුමට බැර කළ යුතු ගනුදෙනු හර කර තිබූ අතර හර කල යුතු ගනුදෙනු බැර කර තිබුණි.

(3) මුදල් පොතේ රු.185,000/- ක ආරම්භක හර ශේෂය සංශෝධිත මුදල් පොත සකස් කිරීමේදී සමහර අයදුම්කරුවන් විසින් එම ශේෂය බැරට ඇතුළත් කර තිබුණි.

(4) සංශෝධිත මුදල් පොත තුලනය කර අවසාන ශේෂය ඉදිරියට ගෙන නොතිබිණි.

(5) මුදල් පාලන ගිණුමේ ආරම්භක ශේෂය ලෙස බැංකු ප්‍රකාශනයේ සඳහන් ආරම්භක ශේෂය සටහන් කර තිබුණි.

**(b) බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී නිරීක්ෂණය වූ පොදු දුර්වලතා:**

(1) බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුත්තේ කුමන ආකාරයේ ගනුදෙනු ද යන්න පිළිබඳව අයදුම්කරුවන් තුළ පැහැදිලි අවබෝධයක් නොතිබීම නිසා ගලපන ලද මුදල් පාලන ගිණුමේ සටහන් කළ යුතු ගනුදෙනු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සටහන් කර තිබුණි.

(2) සංශෝධිත මුදල් පොතේ හර ශේෂය අනුව සමහර අයදුම්කරුවන් විසින් සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ‘‘ඉදිරිපත් නොවූ චෙක්පත්’’ එකතු කිරීම වෙනුවට අඩු කර තිබූ අතර ‘‘තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්’’ අඩු කිරීම වෙනුවට එකතු කර තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** වශයෙන් අනු කොටස් දෙකකින් සමන්විත වේ.

**(a) කොටස** මඟින් දී ඇති එක් එක් ගනුදෙනුව තුළින් ගිණුම්කරන සමීකරණයට වන බලපෑම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි.

**(b) කොටසින්** 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ලාභය ගණනය කිරීමට උපදෙස් ලබා දී තිබුණි.

**(a) ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම්:**

(1) ඉදිරිපත් කර ඇති එක් එක් ගනුදෙනු මඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පිළිබඳව එනම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් වැඩිවීම හෝ අඩු වීම පිළිබඳව සමහර අයදුම්කරුවන් තුළ නිවැරදි අවබෝධයක් නොමැතිව සමීකරණයේ ධන හා ඍණ අගයන් රහිතව සටහන් ඉදිරිපත් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන් අදාල ගනුදෙනු මඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වත්කම් පැත්තේ හෝ වගකීම් පැත්තේ පමණක් තනි සටහනක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(3) ගිණුම්කරණ සමීකරණයේ දී ඇති ගනුදෙනු වල මුල්‍යමය අගයන් සටහන් කිරීම වෙනුවට ‘‘වැඩි වීම’’ ‘‘අඩු වීම’’ යනුවෙන් වචනයෙන් සඳහන් කර තිබුණි.

(4) ගනුදෙනු අංක (3) හි සඳහන් ණයට හා අත්පිට විකුණන ලද භාණ්ඩ සම්බන්ධයෙන් සමහර අයදුම්කරුවන් ලාභය නිවැරදිව ගණනය කර ඉදිරිපත් කර නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් අංක (4) සඳහන් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති වීම මත ප්‍රාග්ධනය ‘‘වැඩිවීම’’ හා වගකීම් ‘‘අඩුවීම’’ ලෙස ඉදිරිපත් කර තිබුණි.

(6) ගනුදෙනු අංක (5) අනුව ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන්ම පියවීමේදී 5% මුදල් වට්ටම නිවැරදිව ගලපා නොතිබිණි.

**(b) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ලාභය ගණනය කිරීම:**

බොහොමයක් අයදුම්කරුවන් දී ඇති ගනුදෙනු නිවැරදිව අවබෝධ කරගෙන ලාභය නිවැරදිව ගණනය කර රු.360,000/- ක ලාභයක් ඉදිරිපත් කර තිබුණි.

තවත් සමහර අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් ලාභයට වන බලපෑම පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම මත වැරදි ලාභයන් ඉදිරිපත් කර තිබුණි.

උදා:- රු.385,000/- , රු.300,000/-

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛනය (නිෂ්පාදන ගිණුම) පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නය මඟින් සිදුකර තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් විසින් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණු අතර පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) නිවැරදි ආකෘතියේ ඉදිරිපත් කර නොතිබුණි.

(2) නොනිමි වැඩ ප්‍රාථමික පිරිවැයට ගැලපීම් නොකර නිෂ්පාදන පිරිවැයට ගැලපීම් කර තිබුණි.

(3) සෘජු වේතන, සෘජු වියදම් යටතේ ගැලපීම් කළ යුතු වුවද සමහර අයදුම්කරුවන් පොදු කාර්ය වියදම් ලෙස සටහන් කර තිබුණි.

(4) අමුද්‍රව්‍ය අවසාන තොගය අමුද්‍රව්‍ය මුල් තොගය ලෙස මාරු කර ඉදිරිපත් කර තිබුණි.

(5) නිෂ්පාදන පිරිවැය මත 18 % ක ලාභ අතිරික්තය ගණනය කර නොතිබුණි.

(6) පාරිභෝජනය කළ අමුද්‍රව්‍ය, ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන ලද අගයන් හි සඳහන් නොවීය.

(7) විදුලිය, කුලිය හා ආරක්ෂක ගාස්තු සඳහා ලබා දී ඇති ප්‍රතිශත භාවිතා කිරීමෙන් කර්මාන්තශාලා සහ කාර්යාලය අතර පොදුකාර්ය වියදම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(8) යන්ත්‍ර හා පිරියත සහ මෝටර් ලොරි රථය සම්පූර්ණයෙන් කර්මාන්ත ශාලාවේ කටයුතු සඳහා යොදවා ගනු ලබන බව පැහැදිලිව සඳහන් කර තිබුණද මීට අදාළ ක්ෂය වීම පොදු කාර්ය වියදම් යටතේ ඉදිරිපත් කර නොතිබිණ.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a), (b)** හා **(c)** ලෙස කොටස් තුනකින් සමන්විතය.

**(a) කොටසින්** වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කිරීමටත් **(b) කොටසින්** අවිනිශ්චිත ගිණුම පිළියෙළ කිරීමටත් **(c) කොටසින්** 2025.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද ලාභය ගණනය කිරීමටත් උපදෙස් ලබා දී තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් සතුටුදායක මට්ටමක පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර, පහත සඳහන් දුර්වලතා හා වැරදි පොදුවේ දක්නට ලැබුණි:

**(a)**

(1) ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කර තිබීම.

(2) ජර්නල් සටහනට අදාල හර හා බැර අගයන් ජර්නල් සටහන් ලිවීමේදී මාරුකර ඉදිරිපත් කර තිබුණි.

(3) ජර්නල් සටහන් පිළියෙල කිරීමේදී ජර්නලයේ ගනුදෙනුව ඉදිරියෙන් හර හා බැර යනුවෙන් සටහන් කර නොතිබුණි.

(4) අවිනිශ්චිත ගිණුම මඟින් නිවැරදි කළ යුතු වැරදි සටහන් හඳුනාගෙන නොතිබීම.

(5) අයිතම අංක (1) ට අදාලව මිලදී ගත් මුද්‍රණ යන්ත්‍රය වෙනුවෙන් වාර්තා නොකරන ලද රු.20,000/- ක ක්ෂය වීමට අදාළ නිවැරදි ජර්නල් සටහන ඉදිරිපත් කර නොතිබිණි.

(6) අයිතම අංක (3) හි සඳහන් වරද නිවැරදිව තේරුම් නොගෙන අවිනිශ්චිත ගිණුම හර කිරීම වෙනුවට ගමන් වියදම් ගිණුම හර කර තිබුණි.

(7) අයිතම අංක (4) හි සඳහන් වරද නිවැරදිව තේරුම් නොගෙන, රු.25,000/- ක හා රු.2,500/- ක් යන අගයන්ගේ වෙනස වන රු.22,500/- වෙනුවට එම අගයන් දෙකේ එකතුව ජර්නල් සටහන් මගින් ඉදිරිපත් කර තිබුණි.

**(b) අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:**

(1) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය ගිණුමේ බැර ලෙස සටහන් කර තිබුණි.

(2) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය අවිනිශ්චිත ගිණුමේ හර පැත්තේ සටහන් කර නොතිබුණි.

(3) අවිනිශ්චිත ගිණුමට අදාල හර සටහන් එම ගිණුමේ බැර පැත්තේ ද බැර සටහන් එම ගිණුමේ හර පැත්තේ ද වශයෙන් පැති මාරු කර ගිණුමේ සටහන් කර තිබුණි.

(4) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය අවිනිශ්චිත ගිණුමේ පහළට ගෙනගිය ශේෂය ලෙස සටහන් කර තිබුණි.

**(c) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ සඳහා ගලපන ලද ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:**

(1) කෙටුම්පත් ලාභයට එකතු කළ යුතු අයිතම අඩු කිරීමටත් අඩු කළ යුතු අයිතම එකතු කිරීමත් කර තිබුණි.

(2) ලාභය සංශෝධනය කිරීමේදී කෙටුම්පත් ලාභය වන රු.250,000/- අදාළ කරගෙන නොතිබිණි.

(3) අයිතම අංක (1) සිට (5) දක්වා පසුව හඳුනාගන්නා ලද ගනුදෙනුවල වැරදි නිවැරදි කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් අයදුම්කරුවන් තුළ නොතිබීම මත ලාභය ගැලපීමේදී එම ගනුදෙනුවලින් වන බලපෑම සැලකිල්ලට ගෙන නොතිබිණි.

(4) සමහර අයදුම්කරුවන් මේ සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a)** හා **(b)** වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. සමස්ත කාර්යසාධනය හොඳ මට්ටම පැවතුණි.

**පොදුවේ නිරීක්ෂණය වූ වැරදි හා අඩුපාඩු පහත පරිදි වේ:**

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීම:**

(1) වර්ෂයට අදාල නිවැරදි ක්ෂය ප්‍රමාණය සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ආදායම් ප්‍රකාශයට ගෙන නොතිබීම.

(2) විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව අවබෝධයක් නොමැති වීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු සමහර අයිතමයන් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර තිබුණි.

(3) බොල් ණය වශයෙන් වර්ෂය තුළ ලියා හරින ලද රු.1,000,000/- ක මුදල සටහන් කර නොතිබුණි.

(4) දළ ලාභය ගණනය කිරීම සඳහා සමහර අයදුම්කරුවන් විසින් වර්ෂයේ මුල් තොගය අඩුකර අවසාන තොග එකතු කර තිබුණි.

(5) ශේෂ පිරික්සුමේ අයිතමයන් දහස් ගණනින් හා ගැලපිළි වල අයිතමයන් සම්පූර්ණ අගයන් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි.

(6) ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම වූ රු.8,000,000/- න් ඉඩමේ වටිනාකම වූ රු.4,000,000/- අඩුකර ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.4,000,000/- අදාළව ක්ෂයවීම ගණනය කළ යුතු වුවද අයදුම්කරුවන් විසින් මුළු වටිනාකම වූ රු.8,000,000/- සඳහාම ක්ෂයවීම ගණනය කර තිබුණි.

(7) වෙළඳ ලැබිය යුතු මුදලින් රු.1,000,000/- බොල් ණය ලියා හැරීමෙන් පසු අඩමාන ණය සඳහා වූ 10% වෙන් කිරීම ගලපා නොතිබිණි.

(8) 2026 මාර්තු 01 දින 12% වාර්ෂික පොලියට ලබාගන්නා ලද රු. 3,000,000/- බැංකු ණය සඳහා වූ මාසයකට අදාල රු.30,000/- පොළී වියදම වෙනුවට වර්ෂයට අදාළ පොලිය වශයෙන් රු.360,000/- සටහන් කර තිබිණි.

(9) 2025 ඔක්තෝබර් 01 දින රු. 200,000/-කට මිලදී ගන්නා ලද පරිගණකය සඳහා 25% බැගින් මාස 06 ක ක්ෂයවීම වන රු.25,000/- ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(10) 2026 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණු විගණන ගාස්තු රු.60,000/- ක මුදල විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කර නොතිබිණි.

(11) විකුණුම් ආපසු එවුම් රු.200,000/- ක වටිනාකම විකුණුම් වලින් අඩුකළ යුතු වුවද එය වියදමක් ලෙස සටහන් කර තිබුණි.

(12) කාර්යාල නඩත්තු වියදම් වල ඇතුළත් රු.200,000/- ක් වටිනා පරිගණකයේ වටිනාකම අඩු කිරීමට කටයුතු කර නොතිබුණි.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කිරීම:**

(1) වර්ෂය තුළ කපා හරින ලද බොල්ණය හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදන වෙළඳ ලැබිය යුතු මුදල් වලින් අඩු කර නොතිබුණි.

(2) 2025 අප්‍රේල් 01 දිනට වූ සමුච්චිත ක්ෂය වීම එකතු නොකර වර්ෂයේ ක්ෂයවීම පමණක් සමුච්චිත ක්ෂය ලෙස පෙන්වා තිබුණි.

(3) ගෙවිය යුතු විගණන ගාස්තු හා ණය පොලී ජංගම බැරකම් යටතේ සටහන් කර නොතිබුණි.

(4) 2026 මාර්තු 01 දින ලබා ගන්නා ලද බැංකු ණය වෙනුවෙන් අදාල කාල සීමාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් උපචිත බැංකු ණය පොලිය වර්ෂයකට වැරදියට ගණනය කර ඉදිරිපත් තිබුණි.

(5) 2026 මාර්තු 01 දින ලබා ගන්නා ලද බැංකු ණය ජංගම වගකීම් යටතේ ඉදිරිපත් කළ යුතු වුවද, සමහර අයදුම්කරුවන් විසින් ජංගම නොවන වගකීම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(6) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කළ යුතු අයිතමයන් පිළිබඳව මූලික අවබෝධයක් නොමැතිකම නිසා මිලදී ගැනුම්, විකුණුම් , ආරම්භක තොගය කුලී ආදායම සහ වෙනත් වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(7) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතමයන් වර්ගීකරණය සිදු නොකර සියලුම අයිතමයන් එකට සටහන් කිරීම. උදාහරණ: ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්, ස්කන්ධය හා වගකීම්, ජංගම වගකීම් යනුවෙන්.

(8) වෙළඳ ලැබිය යුතු මුදල් ජංගම බැරකම් යටතේ ද, වෙළඳ ගෙවිය යුතු මුදල් ජංගම වත්කම් යටතේ ද, සටහන් කර තිබුණි.

(9) ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම ඉදිරිපත් නොකර තනි අයිතමයක් ලෙස ජංගම නොවන වත්කම් යටතේ ඉදිරිපත් ගණනය කර තිබුණි.

(10) 2025 ඔක්තෝම්බර් 01 දින රු.200,000/- කට මිලදී ගත් පරිගණකය, කාර්යාල උපකරණ යටතේ එකතු කර නොතිබුණු අතර සමහර අයදුම්කරුවන් ජංගම නොවන වත්කම් යටතේ වෙනම ඉදිරිපත් කර තිබුණි.

(11) පරිගණකයට අදාළ මාස 06 ක්ෂය වීම, ක්ෂය වෙන් කිරීම යටතේ ඉදිරිපත් කර නොතිබිණි

- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**

2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**

3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**

4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**

5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**

6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**

7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**

8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**

9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -